**විශ්වවිද්‍යාල රෝහල**
**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය**

# පුරප්පාඩු

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත "අක්ෂි තාක්ෂණවේදී" තනතුර සඳහා අදාළ සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ**
**(අර්ධ කාලීන - පැයකට ගෙවීමේ පදනම මත)**

**සුදුසුකම්:**

i. සිංහල/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.

සහ

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් විද්‍යා විෂය ධාරාවෙන් භෞතික විද්‍යාව විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව රසායන විද්‍යාව, ජීව විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතුරින් විෂයයන් 02 ක් එකවර සමත් වීම.

සහ

iii. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන අක්ෂි තාක්ෂණවේදි දෑ අවුරුදු පූර්ණ කාලීන ඩිප්ලෝමා පුහුණු පාඨමාලාව සමත්ව තිබීම.

සහ

iv. අක්ෂි තාක්ෂණවේදියෙකු ලෙස ශ්‍රී ලංකාව තුල කටයුතු කිරීමට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචිය ලබා තිබිය යුතුය.

**<u>පොදු කොන්දේසි</u>**

1. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

2. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

3. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනය වන විට අයදුම්කරුවන් සියලු සුදුසුකම් සම්පූර්ණ කොට තිබිය යුතුය.

4. එක් පැයක් සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ 2017.06.02 දිනැති චක්‍රලේඛ අංක TA/G/PSM/13/2016 අනුව ගෙවීම් සිදු කරනු ලැබේ.

5. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ජායා පිටපත් ලියාපදිංචි තැපැලෙන් 2022.10.17 දිනට පෙර **"විධායක අධ්‍යක්ෂක, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"** යන ලිපිනයට යොමු කල යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

6. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ.

7. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමු කරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. අයදුම්පත්‍රය භාගත කිරීම සඳහා පහත වෙබ් අඩවියට පිවිසෙන්න.

www.kdu.ac.lk